
# 12 පැවිදි දිවිය



12.1 රූපය - පැවිදිවරු

පැවිදි ජීවිතය මුළුමනින් ම දෙවියන් වහන්සේට කැපවුණු ජීවිතයකි; විශේෂ දේව කැඳවීමකි. පැවිදි අය ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් මෙහෙයවනු ලැබ ජේසුස් වහන්සේ අනුගමනය කරන්නට ද සියල්ලට ම වැඩියෙන් දෙවියන් වහන්සේට ආදරය කරන්නට ද දේව රාජ්‍යයේ සහ පැමිණෙන ජීවිතයේ මහිමය ප්‍රකාශ කරන සලකුණක් වන්නට ද අදහස් කරති.



## පැවිදි පූජක නිකායයන්

පැවිදි පූජක නිකායයනට අයත් පැවිද්දෝ පූජකවරය නමැති දේව ප්‍රසාද නිධානය ලබා ගනිති. එම නිසා ඔවුනට දිව්‍ය පූජාව පැවැත්විය හැකි ය. මොවුහු ශ්‍රේෂ්ඨයකු යටතේ නිශ්චිත ව්‍යවස්ථාවක් අනුගමනය කරන අතර ස්වර්ගීක ජීවිතය මෙලොව අත්දැකීමට උත්සාහ කරති.

පැවිදි පූජක නිකායයනට උදාහරණ:

- නිර්මල මරිය නිකාය
- ජේසු නිකාය
- සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකාය
- දිව්‍ය සත්ප්‍රසාදීය නිකාය
- ෆ්‍රැන්සිස්කාන තුන්වන නිකාය
- ක්ලැරේසියාන නිකාය

## පූජක නොවන පැවිදි නිකායයන්

මොවුහු පැවිදි සොයුරන් හා පැවිදි සොයුරියන් යනුවෙන් කොටස් දෙකක් වෙති. මොවුනට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බෙදා දීමේ සේවාව ඉටු කළ හැකිය.

පැවිදි සොහෝදරතුමන්ලාට උදාහරණ:

- මාරිස්ට් සහෝදරතුමන්ලා
- ෆ්‍රැන්සිස්කාන ධර්මදූත සහෝදරතුමන්ලා
- ද ලා සාල් සහෝදරතුමන්ලා
- දයාවේ සහෝදරතුමන්ලා

පැවිදි සොයුරියනට උදාහරණ:

- ශුද්ධ වූ පවුලේ පැවිදි සොයුරියෝ
- අපෝස්තලික කාර්මෙල් පැවිදි සොයුරියෝ
- යහපත් එඬේරාගේ පැවිදි සොයුරියෝ
- සූරදූතික පැවිදි සොයුරියෝ
- දිව්‍ය ගැලවුම්කරුවාණන්ගේ පැවිදි සොයුරියෝ
- සිරි කුරුස පැවිදි සොයුරියෝ
- දොමිනිකාන පැවිදි සොයුරියෝ

සියලු ම පැවිදි නිකායනට අයත් පැවිදි අය දෙවියන් වහන්සේ වෙනුවෙන් තමන්ගේ ජීවිත කැපකරති. ඔව්හු;


1. දිළිඳුකම
2. කීකරුකම
3. ව්‍රත ශුද්ධිය

යන වේදහාර තුන භාර ගනිති. මොවුහු වේදහාර පිළිබඳ ප්‍රථම පොරොන්දු දී වසර කිහිපයකට පසු සදකාලික පොරොන්දු ගනිති. දේව රාජ්‍ය ගොඩනැගීම පැවිදි වූවන්ගේ ප්‍රධාන කාර්යයි.

පැවිදි ජීවිතය ගත කරන සැම දෙනා ම දේව රාජ්‍යය ගොඩනැගීමේ කාර්යයට සහාය දක්වති. ඔව්හු අධ්‍යාපන, සමාජ සේවා ආදී ක්ෂේත්‍රවල සේවය කරති. එමෙන් ම මීසම්වල ද සේවය කරති. පැවිදි ජීවිතය ගත කිරීමට කැමැති අය ගැඹුරු පුහුණුවක් ලැබිය යුතු ය. පැවිද්දෝ තම සියලු ලෞකික ආශා දමනය කර ගනිමින් දේව රාජ්‍යය ප්‍රකාශ කිරීමේ කාර්යයට හවුල් වෙති. ඔවුහු තමන්ගේ ජීවිත ආදර්ශය තුළින් ඔවුන් දේව රාජ්‍ය පිළිබඳ ව දේශනා කරති.

එක් එක් පැවිදි නිකායේ ආරම්භකයාගේ පරමාර්ථ අනුව ඔව්හු සේවය කරති. එම සේවා ඉටු කිරීම තුළින් ක්‍රිස්තුන් වහන්සේගේ ධර්මදූත සේවාවට ඔව්හු දායක වෙති.

| පැවිදි නිකාය | දූතික සේවා |
|---|---|
| • නිර්මල මරිය නිකාය  | දිළිඳුනට සුබාරංචිය දේශනා කිරීම ධර්ම විවේක පැවැත්වීම, මීසම් සේවය රෝහල් සේවය |
| • සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකාය  | අධ්‍යාපනය, මීසම් සේවාව, දේව මහිමය සඳහා සාමූහික ව දිවි ගෙවීම |
| • මාරිස්ට් සහෝදර පැවිදි නිකාය  | අධ්‍යාපන සේවය, තරුණයින් සඳහා ස්වයං රැකියා පුහුණුව ලබා දීම |

| | |
|---|---|
| • ද ලාසාල් සහෝදරතුමන්ලා  | අධ්‍යාපන සේවය, තරුණ ජීවිත සඳහා විවිධ සේවාවන්, ස්වයං රැකියා පුහුණුව |
| • ශුද්ධ වූ පවුලේ නිකාය  | අධ්‍යාපන සේවය, ධර්මෝපදේශ සේවය, ධර්මදූත සේවය |
| • අපෝස්තලික කාර්මෙල් පැවිදි සොයුරියන්  | පාසල් අධ්‍යාපනය, වැඩිහිටි අධ්‍යාපනය මීසම් සේවා |
| • යහපත් එඬේරාගේ පැවිදි සොයුරියන්  | තරුණියන් සඳහා විවිධ සේවා, පාසල් අධ්‍යාපනය, අනාථ වූ තරුණියන්ගේ ජීවිත ගොඩනැගීමට සහාය වීම |
| • සූරදූත නිකාය  | පාසල් සේවය, අනාථ දරු නිවාසවල සේවය ළමා පරපුර හා තරුණියන් වෙනුවෙන් සේවා |
| • දිව්‍ය ගැලවුම්කරුවාණන්ගේ පැවිදි සොයුරියන්  | ධර්මදානය, දිළිඳු අසරණ පීඩිත ජනතාවට පිහිට වීම, මීසම් සේවාව |
| • සිරි කුරුස පැවිදි සොයුරියන්  | සෞඛ්‍ය සේවාව, වතු කම්කරු ජනතාව සඳහා සේවාව, ධර්මෝපදේශය |
| • දොමිනිකාන පැවිදි සොයුරියෝ  | අධ්‍යාපනය, ළදරු පාසල්, ධර්මෝපදේශය, මීසම් සේවය |

මෙලෙස ගිහියන් වෙනුවෙන් සේවය කරන පැවිදිවරුනට සහාය වීම ගිහියන්ගේ යුතුකමකි. ගිහියන් පැවිදිවරුන්ගේ සේවාවනට සහාය විය හැකි ආකාර කිහිපයක් පහත දැක්වේ:

- ඔවුන් හා එක් ව දයාවේ සේවාවල නිරත වීම
- ඔවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම
- ඔවුනට ගරු කිරීම
- දේව රාජ්‍යය පතළ කිරීමේ කටයුතුවල දී සහාය දැක්වීම
- දේව කැඳවීම් වෙනුවෙන් දිරිගැන්වීම, යාච්ඤා කිරීම

ඔබටත් සමහර විට පැවිදි ජීවිතය සඳහා කැඳවීමක් ලැබිය හැකි ය. එවැනි කැඳවීමක් පතා ඔබටත් යාච්ඤා කළ හැකි ය.

### ක්‍රියාකාරකම

1. පහත සඳහන් කරුණු යටතේ වචන 100කට නොඅඩු නිර්මාණාත්මක රචනාවක් ලියන්න.
   - පැවිදි ජීවිතය යනු
   - පැවිදි ජීවිතය දේව කැඳවීමක් බව
   - පැවිදි ජීවිතයේ උතුම්කම
2. පැවිදිවරුන්ගේ සේවාවනට සහාය විය හැකි ආකාර **හතරක්** ලියන්න.



**ජීවිතයට බිඳක්**

***පූජක හෝ පැවිදි දිවියට කැඳවීමක් පතා යාච්ඤා කරන්න.***



නොමිලේ බෙදාහැරීම සඳහා ය.